# ත්‍රිලක්ෂණයෙහි තාර්කික ස්ථාවරය

ගෞරව ශාස්ත්‍රවේදී පහලගම ධම්මික හිමි

අනිත්‍ය (impermanent) (අස්ථිර) දුක්ඛ (suffering) (දුක) අනාත්ම (soulless) (සාර වශයෙන් ගත හැකි දෙයක් නොවීම) යන ලක්ෂණත්‍රයේ ඓක්‍යයට ත්‍රිලක්ෂණය යනුවෙන් ව්‍යවහාර කරනු ලබයි. විදර්ශනා ප්‍රඥාවට ගෝචර වන්නේ ද මෙම ත්‍රිලක්ෂණයයි. එයින් විනිර්මුක්ත වීම නිර්වාණ සාධනය ද අපේක්ෂාභංගත්වයට හේතුවෙයි. මෙම ධර්මතාව ජීව අජීව සර්ව භෞමික වස්තූන්ට පොදු වූ ලක්ෂණයකි. එම නිසාය, ''යදනිච්චං තං දුක්ඛං යං දුක්ඛං තදනත්තා''[1] යමක් අනිත්‍ය නම් එය දුකක් බවත් එකී දුක් සහගත සෑම දෙයක් ම ආත්ම සාර වශයෙන් ගත නොහැ කි බව දක්වෙයි. එතං මම (මගේය) එසො හමස්මි (මම වෙමි) එසො මෙ අත්තා (මෙය මාගේ ආත්මය වෙමි) වශයෙන් අස්මිමානයට පත්විය නොහැකිය. සෑම දෙයකට ම පොදු වූ තත්ත්වයකි.

අනිත්‍ය නම් ස්ථිර පැවැත්මක් නොවීමයි. ''විනාශවනාර්ථයෙන් අනිත්‍ය නම් වෙයි''[2] වෙනස් වීමකින් තොරව ඒකාකාරව නොපැවතීමයි. එනම් නිත්‍ය, (permanent) ධ්‍රැව, (constant) අවිපරිණාමී (non changing) යනාර්ථයන්ගේ විරුද්ධාර්ථයයි. එනම් නිරන්තරයෙන් වෙනස් වීමට ලක්වීමයි. අලගද්දූපමසූත්‍රවර්ණනාවේ දී ''තස්මා අනිච්චං උප්පාද-වයත්ත-තාවකාලික-නිච්චපටික්ඛේපට්ඨේන චාති චතූහි කාරණෙහි

අනිච්චං''[3] යමක ඉපදීම, ඇතිවීම, විනාශවීම, පැවැතීම, ස්ථිර පැවැත්මක් නොමැති වීම යන ලක්ෂණ හතර අනිත්‍ය යනුවෙන් හඳුන්වනු ලබයි. ස්ථිර වශයෙන් සදාකාලික ව එක ම ආකාරයකට යම් දේක පැවැත්ම සිදු නොවීම මෙම ලක්ෂණයෙන් ප්‍රකට කරනු ලබයි. නොසිදී නොනැසී පවත්නා තත්ත්වය සත්‍ය ලෙස ගතහොත් ඔහුට ශාස්වත දෘෂ්ටිය ඇති වෙයි. එබඳු ශාස්වත දෘෂ්ටිගතිකයෙකි බකබ්‍රහ්ම. ඔහුගේ දෘෂ්ටිය වූයේ මෙයයි. ''ඉදං නිච්චං අවචනධම්මං ඉදං සස්සතං න ජීයති, න චවති න උප්පජ්ජති ඉතොව පනඤ්ඤං නිස්සරණං නත්ථි''[4] මෙම බකබ්‍රහ්මයා බ්‍රහ්ම ලෝකය පිළිබඳව කරන ප්‍රකාශනයෙන් පැහැදිලි වන්නේ ඔහුගේ ආත්ම දෘෂ්ටිය දැඩි ලෙස ග්‍රහණය කොට ගෙන ඇති බවයි. ධ්‍යාන භාවනා තුළින් ඔහු ලත් අත්දැකීම් හා ධ්‍යානයේ පවත්නා සුඛය නිසා ඔහු ශාස්වත දෘෂ්ටියට පත්වූවා විය හැකිය. බකබ්‍රහ්ම ශාස්වත තත්ත්වය පැහැදිලි කිරීමට යොදාගන්නා වචන රාශියකි. නිච්චං යනු නිත්‍ය බවයි. ''ඉදං නිච්චන්ති ඉදං සහොකාසෙන බ්‍රහ්මට්ඨානං අනිච්චං නිච්චන්ති වදන්ති'' අනිත්‍ය වූ බඹ ලොව නිත්‍ය සේ කීම, ධුව ස්ථිර යනු ''තත්ථධුවන්ති ථිරං'' ධුව යනු ස්ථිර බවයි. සස්සතං යනු ශාස්වත හෙවත් සදාකාලික පැවැත්මයි. ''සස්සතන්ති සදා විජ්ජමානං'' කේවලං යනු කඩ නොවුණු ''කේවලන්ති අඛණ්ඩං සකලං'' කඩ නොවී පැවැත්තම. අවචනධම්මං යනු ව්‍යය නොවන ස්වභාවයයි. ''අවචනසභාවං න ජායතී'' ඉපදීම, මැරීම, ඉපැද්දවීමක් නොමැති බව ප්‍රකාශ කිරීමයි. ''ඉදං හි න ජායතීති ආදිසු ඉමස්මිං ඨානෙ කොචි නත්ථීති සන්ධාය වදති පඤ්ඤන්ති ඉතො සහොකාසො බ්‍රහ්මට්ඨානං උත්තරිං අඤ්ඤං නිස්සරණං නාම නත්ථීති එවමස්ස ථාමගතස්ස සස්සත දිට්ඨි උප්පන්නා හොති''[5] බ්‍රහ්ම ලෝකය පිළිබඳ පවත්නා වූ ස්ථිර නිත්‍ය ස්වභාවය මෙයින් දක්වේ. ආත්ම දෘෂ්ටියෙන් රෝගී වූ බවත්, මෙම බකබ්‍රහ්මයා දෙස බැලීමෙන් පෙනී යයි. ඔහු බුදුරදුන් සුවපත් කළේ ඤාණය නැමැති අගධයෙනි. (දුග්ගාහ දිට්ඨි භුජගෙන සුදට්ඨ හත්ථං බ්‍රහ්මං විසුද්ධි ජුතිමිද්ධි බකාභිදානං ඤාණාගධෙන විදිනා ජිත වා මුනින්දො) ඊට අමතරව සච්චක, පායාසි රාජඤ්ඤ, උපාලි, වැනි අය ද ශාස්වත (eternal) දෘෂ්ටියෙහි බැසගත්තෝ වෙති. ලෝකය

හා සත්ත්වයා පිළිබඳ අනිත්‍ය හෙවත් යථාර්ථයේ ස්වභාවය තේරුම් කොටගත් විට ශාස්වත දෘෂ්ටිය ප්‍රහාණය වෙයි. බුදුරදුන් ස්වකීය ප්‍රථම ධර්මදේශනයේ දී ම අන්ත භජනය කිරීම හා එහි පවත්නා නිශ්සාරත්වය පෙන්වා දෙමින් අන්ත භජනය නොකළ යුතු බව පැහැදිලි කරයි. ''යොචා'යං කාමෙසු කාමසුඛල්ලිකානු යොගො හීනො ගම්මො පෝථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො අත්තකිලමථානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො''[6] ශාස්වත හා උච්ඡෙද යන උභය දෘෂ්ටිය ම අනාර්ථය හීන වූ පුහුදුන්ගේ සේවනය වූ ග්‍රාම්‍ය දෙයක් වශයෙන් පෙන්වා දෙයි. එසේ ම මාධ්‍යමික දර්ශනය වැනි දර්ශනයන් ද අන්ත භජනය නොකිරීම අගය කොට තිබේ. එහි දී, ''සර්ව දෘෂ්ටිප්‍රහාණාය යඃ සද්ධර්මමදේශයත් අනුකම්පාමුපාදාය තං නමෂ්‍යාමි ගෞතමම්'' (මූලමාධ්‍යමිකකාරිකාව) යම් කෙනෙක් සියලු දෘෂ්ටි ප්‍රහාණය සඳහා අනුකම්පාවෙන් ධර්මය දේශනා කළේ ද එම ගෞතමයන් වහන්සේට මම නමස්කාර කරමි, වශයෙන් මාධ්‍යමිකකාරිකාව අවසන් කරමින් නාගර්ජුනපාදයන් දෘෂ්ටිග්‍රාහිත්වයෙන් තොර වීම අගය කොට ඇත. මෙසේ අනිත්‍ය තත්ත්වය නිසා ඇති වන්නේ දුකයි. යදනිච්චං තං දුක්ඛං යනුවෙනි. දුක විවිධාකාර වෙයි. දුක්ඛ දුක්ඛ (සාමාන්‍ය දුක) ඇති වීම, පැවැතීම හා විනාශ වීම මුල් කොට ගෙන ඇති වෙන චිත්ත පීඩාව ශෝකය මෙයින් කියැවේ. විපරිණාම දුක්ඛ (වෙනස්වීමේ දුක) ක්ෂණයක් ක්ෂණයක් පාසා වෙනස් වීම නිසා දුක සැප වෙනස් වීම භාජනය වෙයි. එහි දී ඇති වෙන දුක මෙයින් ගම්‍ය වෙයි. සංඛාර දුක්ඛ (සංස්කාර දුක) හේතුප්‍රත්‍ය සමවාය හේතුවෙන් පංචස්ඛන්ධය මුල්කොට ඇති වෙන දුකයි. සංස්කාර නිරන්තරයෙන් වෙනස් වන සුලුය. (සබ්බේ සංඛාර අනිච්චා) එකී වෙනස් වීමේ ස්වභාවය පැහැදිලි කිරීමට බුදුරදුන් මනා සුපැහැදිලි උපමාවක් දක්වා ඇත. එනම්, රූපස්ඛන්ධය පෙණ පිඩකට ද වේදනාස්ඛන්ධය දියබුබුලකට ද සංඥාස්ඛන්ධය මිරිගුවකට ද සංස්කාරස්ඛන්ධය කෙසෙල් කඳකට ද විඤ්ඤාණස්ඛන්ධය මායාවකට ද උපමා කරමින් එහි පවත්නා අනිත්‍ය ස්වභාවය පෙන්වා දෙයි. පංචස්ඛන්ධය මුල් කොට හටගන්නා දුක සංස්කාර දුක නම් වෙයි. එසේ දුක තෙයාකාර ව

විභජනය වෙයි. ''පෙලෙන අරුතින් දුක නම් වෙයි''[7] චතුරාර්ය සත්‍ය (Four Noble Truth) කේන්ද්‍රගත වී ඇත්තේ දුක මතය. එම නිසා පිරිසිඳ දැනගත යුත්තේ ද (පරිඤ්ඤෙය්‍යං) ප්‍රහාණය කළ යුත්තේ ද (පහාතබ්බං) සාක්ෂාත් කළ යුත්තේ ද (සච්ඡිකාතබ්බං) වැඩිය යුත්තේ ද (භාවේතබ්බං) අනෙකක් නොව දුකමය. දුක දැනෙන ආකාර වශයෙන් සමාජගත හා සංසාරගත වශයෙන් දෙයාකාර වෙයි. දුක යන්න විස්තර කරන්නේ මෙසේය, ''ඉදං ඛො පන භික්ඛවේ දුක්ඛං අරියසච්චං ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛො අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ පියේහි විප්පයෝගෝ දුක්ඛෝ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තේන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා''[8] ඉපදීම, වයසට යෑම, ලෙඩවීම, මරණයට පත් වීම, අකමැති අය සමග වාසය කිරීම, වාසයට කැමති අය වෙන් වීම, කැමති දේ නොලැබීම, පඤ්චෝපාදානස්ඛන්ධය ම දුකක් බව පැහැදිලි කරයි. එසේ දුක ඇති වෙන සෑම දෙයක් ම අනාත්ම ලක්ෂණය පෙරටු කොට ඇත. තදනත්තා වශයෙන් දක්වන්නේ එයයි. අනාත්ම නම් න ආත්ම වශයෙන් ගැනීම සාවද්‍යකරය. එසේ උවහොත් බුදුදහම උච්ඡේදවාදය පිළිබිඹු කරයි. වාද හෙවත් අන්ත බැහැර කරන බුදුදහම අනාත්මලක්ෂණය විවරණය කරන්නේ ලොව පවත්නා දෑහි සාර වශයෙන් ගත හැකි දෙයක් නොවන බවයි. ''අනත්තා යනු තමාගේ යැයි ගත හැකි සාරයක් නොමැති බවයි''[9] එය සම්මුති හා පරමාර්ථ තත්ත්වයන් කරා දිවයයි. වෝහාර සත්‍ය හෙවත් සම්මුති සත්‍ය අනුව සත්ත්වයා ඇත. නමුත් එහි පරමාර්ථකථනයේ දී සත්ත්වයෙක් නැත ඇත්තේ ස්ඛන්ධ, ධාතු හා ආයතන පමණි. එය බුදුදහමේ සුප්‍රසිද්දෝපමාවකින් පැහැදිලි කරන්නේ නම්,

> ''යථාහි අංගසම්භාරා හොති සද්දෝ රථො ඉති,
> එවං ඛන්ධෙසු සන්තේසු හෝති සත්තතෝ සම්මුති.''[10]

අංගෝපාංග රාශියක් එක්කොට රථය සකස් වී ඇත්තා සේ ම ස්ඛන්ධාදිය හේතුවෙන් සත්ත්වයා වශයෙන් ව්‍යවහාර කරයි. ඉන් වියුත්ත කළ කල්හි ඒ ඒ ඉන්ද්‍රයන්ට අදාළ නාමයෙන් හඳුන්වනු

විනා සත්ත්වයා යැයි ව්‍යවහාර නොකරයි. එසේ නම් පරමාර්ථ වශයෙන් ගෙන බැලූ විට සුපැහැදිලි වන්නා සේ ලොව පවතින සෑම දෙයක් තුළ ම සාර වශයෙන් ගැනීම දෙයක් නොමැත්තා එසේ ම සාරයක් තිබේ නම් අපගේ ආධිපත්‍යයට යටත්ව පාලනයක් කළ හැකිය. නමුත් අප වයසට යාම, ලෙඩ රෝගවලට ගොදුරු වීම, ජරා ජීර්ණ වීම, මරණයට පත්වීමාදියවත් අපට පාලනය කළ නොහැකි වීමෙන් මනා සේ එය ප්‍රත්‍යක්ෂ වෙයි. එසේ නම් සත්ත්වයා යනු ස්ඛන්ධ එනම් පඤ්චස්ඛන්ධයන් ද දොළොස් ආකාර වූ ආයතන හා දහ අටක් වූ ධාතු වල එකතුවට සත්ත්ව, පුග්ගල ව්‍යවහාර කරනු ලබයි.

> ''ඛන්ධානං පටිපාටි ධාතු ආයතනානි ච,
> හවොච්ඡින්නෝ වත්තමානං සංසාරෝති පවුච්චති.''[11]

යන්නෙන් එය පැහැදිලි වෙයි. නිත්‍ය නොවන නිසා දුක හටගන්න බවත් දුකෙහි පදනම ඇත්තේ අනාත්මතාවය මත බවත් යන්න තුළ ඇත්තේ තර්ක (Logic) පදනම මත සකස් වූ ඉගැන්වීමකි. එබැවින් ත්‍රිලක්ෂණය තාර්කික ස්ථාවරක පිහිටා ඇති බව පෙනේ. බුදුදහම තර්කයේ උපයෝගීතාවය නොව එයින් සත්‍ය කරා එළඹිය නොහැකි බව පෙන්නා දීමට ''මා තක්කහේතු''[12] වශයෙන් කාලාම සූත්‍රයේ දී උගන්වා ඇත. තර්කයෙන් විනිර්මුත්ත වී ත්‍රිලක්ෂණය විස්තර කළ නොහැකිය. බුදු දහමෙන් තර්ක බැහැර කරන්නේ තර්කය මත සුප්‍රතිෂ්ඨාපනය වී එළඹෙන නිගමන සත්‍ය නොවන හෙයිනි. තර්කය යන විධික්‍රමයෙන් අසත්‍ය කරුණක් වුව ද සත්‍ය සේ හුවා දැක්වීමට පුලුවන් හෙයිනි. බුදු දහම ප්‍රමාණ ශාස්ත්‍ර, න්‍යාය ශාස්ත්‍ර, ආන්වීක්ෂිකී, තර්කය හා අනුස්සවය මුලුමනින් ම බැහැර කොට නැත, තිලකුණ පිළිබඳ කෙරෙන මෙම විවරණය තුළින් එය පැහැදිලි වෙයි. එනම්, ''අනිච්චසඤ්ඤාව යනු ස්ඛන්ධ පඤ්චකය ඇති වී නැති වී යන අයුරින් අනිත්‍යයයි උපදින හැඟීමයි, අනිත්‍ය දුක්ඛ සඤ්ඤාව නම් යමක් අනිත්‍ය ද එය පීඩනය පවත්වන අයුරින් දුකක්යැයි උපදින හැඟීමයි, දුක්ඛ අනත්තසඤ්ඤාව නම් යමක් දුක ද එය තමා යටතෙහි නොපවත්නා අයුරින් අනාත්මයයි උපදින හැඟීමයි''[13] ත්‍රිලක්ෂණය ඉගැන්වීමෙහි දී අන්‍යෝන්‍ය

සුලක්ෂණ කථනය කෙරේ තාර්කික චින්තනය භාවිත කරයි. එහි උපයෝගීතාව ගෙන ඇති හෙයින් තර්කය පදනම වී ත්‍රිලක්ෂණය උගන්වා ඇති බව පෙනේ. එසේ බුදු දහම තර්කය හා අනුස්සවය එහි උපයෝගීත්වය මුලුමනින් ම බැහැර කොට නැති බව ඉස්මතු වෙයි.

## ආන්තික සටහන්

1. සංයුත්තනිකාය i. කොටස අජ්ඣාත්ත සූත්‍රය 02 පිටුව. (= බුද්ධ ජයන්ති මුද්‍රණ)
2. අංගුත්තරනිකාය අට්ඨකථා i, 461, 462 පිටු, (= හේවවිතාරණ මුද්‍රණ) 1923. අනිච්චති හුත්වා අභාවට්ඨෙන අනිච්චා.
3. මජ්ඣිමනිකාය අට්ඨකථා ii කොටස, 93 පිටුව.
4. මජ්ඣිමනිකාය i, කොටස, බ්‍රහ්මනිමන්තික සූත්‍රය 764 පිටුව.
5. මජ්ඣිමනිකාය අට්ඨකථා ii කොටස, 336 පිටුව.
6. සංයුත්තනිකාය v කොටස, 270 පිටුව.
7. - එම -
8. අංගුත්තරනිකාය අට්ඨකථා i, 461, 462 පිටු, 1923. දුක්ඛාති සම්පති පීලනට්ඨෙන දුක්ඛා.
9. සංයුත්තනිකාය v කොටස, ධම්මචක්කපවත්තන සූත්‍රය. 272 පිටුව. මහාවග්ගපාළි 20 පිටුව, පටිසම්භිදාමග්ග 92 පිටුව, The Digaha Nikaya, 305p, Edited by T.W. Rhys Devid and J. estlin carpenter, (= PTS)
10. අංගුත්තරනිකාය අට්ඨකථා i, 461, 462 පිටු, 1923. අනත්තා අසවත්තනට්ඨෙන අනත්තා.
11. චුල්ලනිද්දේසපාළි අට්ඨකථා, 71 පිටුව, 1923. Sanyutta Nikaya of the sutta Pitaka, part 1, 13p, Edited By M.Leon Feer, London, 1973.
12. දීඝනිකාය අට්ඨකථා i, 339 පිටුව, 1918. සංයුත්තනිකාය අට්ඨකථා ii, 73 පිටුව, 1927. අංගුත්තරනිකාය අට්ඨකථා ii, 574 පිටුව, 1931. උදානපාළි අට්ඨකථා, 181 පිටුව, 1920. ඉතිවුත්තකපාළි අට්ඨකථා, 46 පිටුව, 1928. ථෙරගාථා අට්ඨකථා i, 152 පිටුව, 1918. චුල්ලනිද්දේසපාළි අට්ඨකථා, 04 පිටුව, 1923. විමතිවිනෝදනී ටීකා, 38 පිටුව, 1935. ධම්මසංගනී ප්‍රකරණ අට්ඨකථා, 09 පිටුව, 1940. විභංග ප්‍රකරණ අට්ඨකථා, 104 පිටුව, 1932. විසුද්ධි මග්ග, 407 පිටුව, 1919. මහාසද්දනීතිප්පකරණය, 52 පිටුව, අරුග්ගොඩ සීලානන්ද හිමි, සංස්කරණ, 1909.

13. අංගුත්තරනිකාය ii, 338 පිටුව. දීඝනිකාය අට්ඨකථා ii, 638 පිටුව, 1925. චුල්ලනිද්දේස පාළි 162 පිටුව. මහානිද්දේස පාළි 494 පිටුව. සංයුත්තනිකාය අට්ඨකථා iii, 169 පිටුව, 1930.

14. අංගුත්තරනිකාය අට්ටකථා ii, 609 පිටුව, 1931. අනිච්චසඤ්ඤාති ඛන්ධපඤ්චකං හූත්වා අභාවකාරෙන අනිච්චන්ති උප්පජ්ජනකසඤ්ඤා අනිච්චේ දුක්ඛසඤ්ඤාති, යදනිච්චං තං පති පීලනාකාරෙන දුක්ඛන්ති, උප්පජ්ජනකසඤ්ඤා දුක්ඛේ අනත්තා සඤ්ඤාති, යං දුක්ඛං තං අවසවත්තකානෙ අනත්තානි උප්පජ්ජනකක සඤ්ඤා.